ගිරිබාව ප්‍රාදේශීය සභාව

කුරුණෑගල දිස්ත්‍රික්කය

--------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1** මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 අප්‍රේල් 07 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 ජූලි 22 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2017 සැප්තැම්බර් 29 දින සභාවේ ලේකම්වරයා වෙත යවා ඇත.

**1.2** <u>තත්ත්වාගණනය කළ මතය</u>

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ගිරිබාව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) යන්ත්‍ර හා උපකරණ යටතේ ගිණුම්ගත විය යුතු රු.1,858,174 ක් වටිනා පරිගණක උපාංග, වායු සමීකරණ යන්ත්‍ර ඇතුළු අයිතම 61 ක් ලී බඩු හා උපකරණ යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී රු.75,000 කට මිලදීගෙන තිබුණු කොන්ක්‍රීට් පුටු කට්ටලය මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාල රු.73,189 ක් වූ ණයහිමියන් මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව රු.161,109,946 ක් වූ හිමිකම් වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල සටහන් 13 හි රු.161 ,421,485 ක් වශයෙන් දක්වා තිබුණි.

(ඉ) විවිධ ආයතනවලින් පරිත්‍යාග ලෙස ලැබී තිබුණු ලී බඩු හා උපකරණ අයිතම 44 ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

**1.3.2 නොසැසඳූ පාලන ගිණුම්**

---------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව ගිණුම් විෂයයන් 04 ක ශේෂ හා අදාල උපලේඛනවල ශේෂ අතර රු.2,066,293 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයට අනුව රු.91,500 ක් වූ පෙර ගෙවුම් තැන්පත් උපලේඛනය අනුව රු.101,500 ක් ලෙස දක්වා තිබුණි.

**1.3.3 අවිනිශ්චිත ගිණුම්**

-------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.429,739 ක් වූ අවිනිශ්චිත ගිණුමේ බැර ශේෂය හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

**1.3.4 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්**

----------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) <u>ලැබියයුතු ගිණුම්</u>

වර්ෂයක කාලයක් ඉක්මවා තිබෙන එකතුව රු.13,815,206 ක් වූ ලැබිය යුතු මුදල් අයකර ගැනීම සඳහා සභාව විසින් විධිමත් පියවරයන් ගෙන නොතිබුණි.

(ආ) <u>ගෙවියයුතු ගිණුම්</u>

කිසියම් කාලයක් තබාගත යුතු තැන්පත් කිරීම් හැර ගෙවිය හැකි අනෙකුත් වගකීම් ගෙවා නිදහස් වීමට සභාව කටයුතු කර නොතිබුණි.

**1.3.5 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ යනාදියට අනුකූල නොවීම**

--------------------------------------------------------------------------------

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය කරනු ලැබේ.

| නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) මුදල් රෙගුලාසි 371(2) ආ | තත්කාර්යය අතුරු අග්‍රිම අවශ්‍යතාවය ඉක්මවා ලබාදී තිබුණි. |
| (ආ) මුදල් රෙගුලාසි 371 (2) ඇ | අවස්ථා 18 කදී අත්තිකාරම් වශයෙන් ලබාගත් රු.188,000 ක් පියවීමට දින 14 සිට දින 125 ක් දක්වා ප්‍රමාද කර තිබුණි. |

## 02 මූල්‍ය සමාලෝචනය

--------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු.86,050 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු.62,379 ක් වීමෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.23,671 ක වර්ධනයක් සිදු වී තිබුණි.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

-------------------------------------

පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.23,671 ක වර්ධනය සඳහා පුනරාවර්තන වියදම්වල අඩුවීම හේතු වී තිබුණි.

### 2.3 ආදායම් පරිපාලනය

------------------------

#### 2.3.1 වරිපනම්

-----------

ප්‍රාදේශීය සභා සීමාව තුළ කාලානුරූපිව නව සංවර්ධිත ප්‍රදේශ හඳුනාගෙන නියමිත පරිදි ගැසට් කර වරිපනම් බදු අය කිරීමට කටයුතු කර නොතිබුණි.

#### 2.3.2 බදු කුලී

----------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට ව්‍යාපාරික ස්ථාන 07 කින් වසර 01 සිට 10 දක්වා කාල පරාසයක් තුළ හිඟව පවතින රු.360,419 ක් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) කඩ කාමර 05 කින් සමාලෝචිත වර්ෂයට අදාල රු.68,750 ක බදු නියමිත පරිදි අයකරගෙන නොතිබුණි.

(ඇ) බදු දිය හැකි වත්කම් 14 ක් සමාලෝචිත වර්ෂය තුළදී බදු දීමට නොහැකි වීමෙන් අවම වශයෙන් රු.294,297 ක අලාභයක් සිදුවී තිබුණි.

**2.3.3** බලපත්‍ර ගාස්තු

-----------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානය වන විට සභා බල ප්‍රදේශය තුළ ස්ථාපිත කර තිබුණු දුරකථන කුළුණු 04 කින් පෙරසැරි ගාස්තු හා අනුකූල සහතික නිකුත් කිරීම සම්බන්ධ අවම ගාස්තු වශයෙන් රු.1,140,000 ක මුදලක් අදාල ආයතනවලින් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) එකම සංඥා කුළුණ භාවිතා කර විවිධ සමාගම් ග්‍රාහකයන් වෙත සේවා සපයන බව නිරීක්ෂණය වුවද, සභාව වාර්ෂික වෙළඳ බලපත්‍ර ආදායම් අයකර ගැනීමේදී මේ සම්බන්ධයෙන් සැලකිලිමත්ව කටයුතු කර නොතිබුණි.

**03.** **මෙහෙයුම් සමාලෝචනය**

-----------------------------

**3.1** **කළමනාකරණ අකාර්යක්ෂමතා**

-----------------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ඉඩම් හා ගොඩනැගිලි ලේඛනය අනුව වූ ඉඩම් කොටස් 17 ක් සඳහා නීත්‍යානුකූල ඔප්පු පිළියෙල කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) බැකෝ ලෝඩරය සහ අංක NW VC 9914 දරන යතුරු පැදිය සභාව නමින් ලියාපදිංචි කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට මුදල් පොතේ ශේෂය රු.962,046 කින් ඉක්මවා චෙක්පත් නිකුත් කර තිබුණි.

(ඈ) 2014 හා 2016 වර්ෂවලදී රු.19,080,506 ක් වැය කර වැඩ නිමකර තිබුණු පැරකුම්පුර හා ගිරිබාව බස්නැවතුම්පොලවල් සමඟ වූ කඩ කාමර 07 බදු දීමට කටයුතු කර නොතිබුණි.

**3.2** **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

------------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) රු.2,000,377 ක් වැයකර සංවර්ධනය කර තිබුණු ගිරිබාව තඹුත්ත උද්‍යානය නිසි නඩත්තුවකින් හා භාවිතයෙන් තොරව පවතින බව 2017 මාර්තු 14 දින සිදු කරන ලද භෞතික පරීක්ෂාවේදී තහවුරු විය.

(ආ) ළදරු උද්‍යාන හා පොළ භූමි නිසි නඩත්තුවකින් තොරව පැවතීම හේතුවෙන් ස්වාභාවික ආපදාවන්ට ලක්ව විනාශ වෙමින් පැවතුණි.

**3.3 නිශ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම්**

-----------------------------------------

ගැලුම් 800 ක ධාරිතාවයකින් යුතු ජල බවුසරයක් වසර 1 ½ ක පමණ සිට කාර්යාල පරිශ්‍රයේ පැවතුණි.

**3.4 හදුනාගත් අලාභ**

------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) පහළ ගිරිබාව හා තඹුත්ත පුස්තකාලවලින් බාහිර පාඨකයින්ට නිකුත් කර වසර 1 - 6 අතර කාලය තුල නැවත භාර නොදුන් පොත් 86 ක වටිනාකම රු.17,681 ක් විය.

(ආ) සේවයෙන් පහකළ, ස්ථාන මාරුවී ගිය හා විශ්‍රාම ගිය තිදෙනෙකුගෙන් වසර 03 සිට වසර 23 දක්වා කාල පරාසයක් තුළ අයවිය යුතු ණය හා අත්තිකාරම් මුදල රු.165,100 ක් විය.

**3.5 කොන්ත්‍රාත් පරිපාලනය**

--------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2014 වර්ෂයේදී රු.1,514,145 ක් වැයකර පහල ගිරිබාව, ගම්පොළ, දම්සෝපුර හා ඉහල ගිරිබාව යන සුසාන භූමි වටා ඉදි කර තිබුණු කටු කම්බි වැටවල් වලට අදාල කොන්ක්‍රීට් කම්බි කණු නිසි ප්‍රමිතියට නොවීම හේතුවෙන් ඇතැම් කණු සමාලෝචිත වර්ෂය අවසාන වන විට කැඩී ගොස් තිබුණි.

(ආ) 2015 වර්ෂයේදී රු.2,628,658 ක් වැයකර ඉදිකර තිබුණු හස්තිකුච්චි රථගාලට අයත් වැසිකිලි පද්ධතියේ ඉදිරිපස වඩිම්බුව, මුදුන් වහලය, ඉදිරිපස දොර හා දොර අගුල දැමීම සහ බිම ටයිල් කිරීම සමාලෝචිත වර්ෂය වන විටද නිසි පරිදි පිළියෙල කර නොතිබුණි.

(ඇ) 2015 වර්ෂයේදී රු.4,000,000 ක් වැයකර ඉදිකර තිබුණු පැරකුම්පුර සතිපොළ ගොඩනැගිල්ලේ ඇතුළත සිමෙන්ති ගෙබිම මීටර් 40.3 x මීටර් 9.6 ක කොටසක් පුපුරා ඉරිතලා බොල්වී තිබුණි.

(ඈ) සඟබෝපුර වී ගබඩාව අසල බෝගස් හන්දියේ සිට පුද්ගලයෙකුගේ නිවස දක්වා මාර්ගය බෝක්කුව දමා ප්‍රතිසංස්කරණය කිරීමේදී රු.494,473 ක් වැයකර බොරළු ඇතිරීම පමණක් සිදු කර තිබූ නමුත් මාර්ගයේ අත්‍යවශ්‍යම අංගය වන කැඩුණු බෝක්කුව ඉදිකර නොතිබුණි.

(ඉ) රු.352,491 ඇස්තමේන්තුවක් මත වැඩ විෂය අංක 2 ක් යටතේ රාජාංගනය යාය 04/02 විදුහලේ ක්‍රීඩා පිටියේ ගස්වැල් ගලවා ඉවත් කර පොළව මට්ටම් කර සකස් කිරීම හා බොරළු සපයා ගොනු කිරීම වෙනුවෙන් ඇස්තමේන්තු මුදලම ගෙවා තිබූ නමුත් ක්‍රීඩා පිටිය ඉතිරි වැඩ නිම කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබූ බැවින් ක්‍රීඩාපිටිය දරුවන්ගේ ක්‍රීඩා කටයුතු සඳහා යොදා ගැනීමට නොහැකි වී තිබුණි.

(ඊ) 2014 වර්ෂයේදී සිදුකර තිබුණු සංගප්පාලය තැලවිල්ල ඉදි කිරීමේ කර්මාන්තයේ වැඩ විෂයය 04 අනුව රු.217,373 ක් වැයකර තැලවිල්ල මතුපිට දැමූ කොන්ක්‍රීට් තට්ටුව මැදින් හරස් අතට පුපුරා තිබූ බව 2017 මාර්තු මාසයේ සිදුකළ භෞතික පරීක්ෂාවේදී අනාවරණය විය.

(උ) මඩිගේ ග්‍රාම නිලධාරී වසමේ වල්පාලුව මොලැව දක්වා මාර්ගය බොරළු දමා සංවර්ධනය කිරීමේදී වැඩ විෂය අංක 03 යටතේ පස් සැපයීමට රු.25,429 ක් ගෙවීම් කර තිබුණද, ඉඩම් හිමියෙකුගෙන් පස් නොමිලේ ලබාගත් බව හා වැඩ විෂය අංක 04 අනුව බොරළු සපයා ගොණු කිරීමට රු.284,698 ක් ගෙවා තිබුණද බොරළු සඳහා රු.22,000 ක් පමණක් ගෙවූ බවට අනාවරණය වූ බැවින් රු.288,127 ක මුදලක් අවභාවිතා කර තිබෙන බවට තහවුරු විය.

**3.6 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය**

-----------------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) අක්කර 05 ක ඉඩමක් වටා වැටක් ඉදි කිරීම, ගේට්ටුවක් සවි කිරීම හා ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථාන භූමිය වශයෙන් පුවරුවක් සවි කිරීම සඳහා ඉකුත් වර්ෂයේ රු.442,758 ක් වැයකර තිබුණද, සමාලෝචිත වර්ෂය වන විටද ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ කටයුතු ආරම්භ කර නොතිබුණි.

(ආ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ වැඩ සටහන යටතේ සමාලෝචිත වර්ෂයේදී වැඩ මුළු පැවැත්වීමට, කසළ බඳුන් ලබාදීමට හා කසළ එකතු කරන ට්‍රැක්ටර් නඩත්තුව වශයෙන් රු.192,505 ක් වැයකර තිබුණද, සභාව විසින් තම බල ප්‍රදේශයේ කසළ එකතු කිරීම සිදුකර නොතිබූ බැවින්, ව්‍යාපාරික ප්‍රජාව හා නාගරික ජනතාව අවට තිබෙන හිස් ඉඩම්වලට හා මාර්ගය ආසන්නයට අවිධිමත්ව කසළ බැහැර කිරීම සිදුකරමින් පැවතුණි.

**3.7 පාරිසරික ගැටළු**

------------------

තඹුත්ත උද්‍යානය, ගිරිබාව ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය, වරා වැව සතිපොළ භූමිය, පහළ ගිරිබාව සතිපොළ භූමිය, පැරකුම්පුර සතිපොළ භූමිය, පැරකුම්පුර සතිපොළ භූමියේ වැසිකිළි පද්ධතිය හා හත්තිකුච්චි රථගාලේ වැසිකිළි පද්ධතිය 2017 මාර්තු 14 වන දින භෞතික පරීක්ෂණ අවස්ථාව වන විට වල් වැදී අපවිත්‍රව පැවතුණි.

## 04 ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

---------------------------------------

### 4.1 අයවැය පාලනය

-----------------

වැය විෂයයන් 05 කට අදාළ රු.1,858,000 ක් වූ අයවැයගත ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම ඉතිරිව තිබුණි.

## 05. පද්ධති හා පාලනය

--------------------

විගණනයේදී අනාවරණය වූ පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් පිළිබඳ දූර්වලතාවයන් වරින් වර මාගේ විගණන විමසුම් මගින් ප්‍රාදේශීය සභාවේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවදානය යොමුකළ යුතුය.

| | පද්ධතිය | නිරීක්ෂණය |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | i. වාර්ෂිකව හෙළිදරව් කරනු ලබන ගිණුම්කරණ අඩුපාඩු අවම කර ගැනීමට කටයුතු නොකිරීම.<br>ii. ලේඛන හා උපලේඛන අතර නොසැසඳීම, ලේඛන නඩත්තු නොකිරීම, මුදල් පොත් දිනපතා තුලනය නොකිරීම හා මුදල් පොතේ බැර ශේෂ ඇතිවන අයුරින් චෙක්පත් ලිවීම. |
| (ආ) | ආදායම් පාලනය | නව තක්සේරු සිදු නොකිරීම, වාර්ෂික බදුදිය හැකි දේපල බදු දීමට කටයුතු නොකිරීම. |
| (ඇ) | ස්ථාවර වත්කම් පාලනය | වත්කම්වල ආරක්ෂාව, වත්කම් නිසි පරිදි නඩත්තු නොකිරීම සහ නිශ්ක්‍රීය හා ඌණ උපයෝජිත, අභාවිත වත්කම් පැවතීම. |

| | |
|---|---|
| (ඇ) ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම | මහජන අවශ්‍යතා මත ව්‍යාපෘති ක්‍රියාත්මක නොකිරීම, ඇස්තමේන්තුවල නාමයන් සංශෝධනය නොකර ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ ප්‍රතිපාදන තිබියදී ඊට අඩු ලංසුවකට ව්‍යාපෘති ලබාදී අතරමග නවතා දමා තිබීම. |
| (ඉ) කසළ කළමනාකරණය | සභාව විසින් දෛනිකව කසළ එකතු නොකරන තත්ත්වය තුළ පාරිසරික ගැටළු මතුවී තිබීම. |